කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

2022 අප්‍රේල් මස 14 දින සඳහා කාලගුණ අනාවැකිය
2022 අප්‍රේල් මස 14 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

**දිවයිනේ බොහෝ ප්‍රදේශවල සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. උතුරු, උතුරු-මැද, නැගෙනහිර සහ ඌව පළාත්වල ඇතැම් ස්ථාන වලට මි.මී. 75 ට වැඩි තරමක් තද වැසි ඇතිවිය හැක.**

**බස්නාහිර සහ දකුණු වෙරළබඩ ප්‍රදේශවල උදෑසන කාලයේදී තැනින් තැන වැසි ඇතිවේ.**

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

දෘශ්‍ය ලෙස සූර්යයා උතුරට ගමන් කිරීමේදී සූර්යයා, අප්‍රේල් මස 05 සිට 15 දක්වා දිනවලදී ශ්‍රී ලංකාව ආශ්‍රිත අක්ෂාංශ වලට සෘජුවම ඉහලින් පවතී. අද (14) දින දහවල් 12:10 ට චුන්නාවිල්, කිලිනොච්චි සහ වඩ්ඩක්කච්චි යන ප්‍රදේශ වලට හිරු මුදුන් වනු ඇත.

### WEATHER FORECAST FOR 14 APRIL 2022
### Issued at 05.30 a.m. on 14 APRIL 2022

Showers or thundershowers will occur at several places over most parts of the island during the afternoon or night. Fairly heavy showers **above 75 mm** can be expected at some places in Northern, North-central, Eastern and Uva provinces.

Showers will occur at several places in Western and Southern coastal areas during the morning.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

On the apparent northward relative motion of the sun, it is going to be directly over the latitudes of Sri Lanka from 05$^{th}$ to 15$^{th}$ of April in this year. The nearest areas of Sri Lanka over which the sun is overhead today (14$^{th}$) are Chunnavil, Kilinochchi and Vaddakkachchi at about 12:10 noon.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

### ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
### 2022 අප්‍රේල් මස 14 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.

**වැසි තත්ත්වය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමා එයි. සුළඟේ වේගය පැ.කි.මී. (20-30) පමණ වේ. කන්කසන්තුරය සිට මන්නාරම හරහා පුත්තලම දක්වාත් හම්බන්තොට සිට පොතුවිල් හරහා මඩකලපුව දක්වාත් වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී.** (35-40) දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

කන්කසන්තුරය සිට මන්නාරම හරහා පුත්තලම දක්වාත් හම්බන්තොට සිට පොතුවිල් හරහා මඩකලපුව දක්වාත් වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු වේ. සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු විය හැක.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

### WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
### Issued at 05.30 a.m. on 14 April 2022

**Condition of Rain:**

Showers or thundershowers will occur several places in the sea areas around the island.

**Winds:**

Winds will be south-westerly and wind speed will be (20-30) kmph. Winds speed can increase up to **(35-40) kmph** at times in the sea areas off the coast extending from Kankasanturai to Puttalam via Mannar and Hambantota to Batticaloa via Pottuvil.

**State of Sea:**

The sea areas off the coast extending from Kankasanturai to Puttalam via Mannar and Hambantota to Batticaloa via Pottuvil will be fairly rough at times. The other sea areas around the island can be moderate.

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි